(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 60.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 මාර්තු මස 23 වැනි බදාදා අ. භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා,** විශේෂ කාර්යභාර අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **නවීන් දිසානායක මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩිලාන් පෙරේරා මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත රන්ගේ බණ්ඩාර මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **සිසිර කුමාර අබේසේකර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

**ගරු ජානක වක්කුඹුර මහතා**

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**

**ගරු ඒ. ඒ. විජේතුංග මහතා**

**ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය**

**ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා**

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**

**ගරු අලී සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

නීල් ඉද්දවල මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිතුමාගෙන් ලත් සංදේශ :** අතිගරු ජනාධිපතිතුමාගෙන් ලැබුණු මතු පළවන සංදේශය කථානායකතුමා විසින් කියවන ලදී,—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

My No . CSA/9/Acts
March 16 , 2016

Honourable Karu Jayasuriya
Speaker
Parliament of Sri Lanka

My dear Speaker,

Reference is made to the Bill titled " Right to Information".

In terms of Article 154 (G) (3) of the Constitution, this Bill was referred to Provincial Councils for the expression of their views thereon.

Accordingly, the Provincial Councils have expressed their views as follows :

| | Province | Details |
|---|---|---|
| 1. | Western | Agreed |
| 2. | North Western | Agreed |
| 3. | Sabaragamuwa | Agreed subject to amendments |
| 4. | Central | Agreed |
| 5. | Eastern | Agreed |
| 6. | Southern | Agreed |
| 7. | Northern Central | Agreed subject to amendments |
| 8. | Uva | Agreed |
| 9. | Northern | Agreed subject to amendments |

Copies of the letters with proposed amendments are annexed.

Yours sincerely,

Maithripala Sirisena

Copy to : Hon. Attorney General

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

I

"පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ නියෝජ්‍ය මහ ලේකම් තනතුර අමාත්‍ය මණ්ඩලයේ අනුමතියෙන් 2016 පෙබරවාරි මස 23 වැනි දින සිට බල පවත්වන පරිදි කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් යනුවෙන් සංශෝධනය කර එකී තනතුර අමාත්‍යාංශ ලේකම්වරයකුගේ මට්ටමට උත්ශ්‍රේණිගත කර තිබෙන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

**II**

"2016 මාර්තු මස 10 වැනි බ්‍රහස්පතින්දා මුදල් අමාත්‍ය ගරු රවි කරුණානායක මහතා විසින් පාර්ලිමේන්තුවේ වයිෆයි පහසුකම් සම්බන්ධයෙන් සභාගර්භයේදී මතු කරන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් මෙම සභාවට නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණයට අදාළව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ පහසුව පිණිස පාර්ලිමේන්තු වෙබ් සයිට් (Parliament Website), ඊමේල් (e-mail), අයි පාලියමන්ට් ඉන්ට්‍රානෙට් පෝටල් (i-Parliament intranet portal), මොබයිල් ඇප් (mobile app) හා වයිෆයි (wifi) යනාදී පහසුකම් දැනටමත් සම්පාදනය කර ඒවා ක්‍රියාත්මකව පවතින බව දන්වා සිටිමි.

පාර්ලිමේන්තුවේ වයිෆයි ජාලයට සම්බන්ධවීමේදී ඕපන් ඇක්සෙස් (open access) සහ ක්ලැසිෆයිඩ් ඇක්සෙස් (classified access) යනුවෙන් ආකාර දෙකකට ඊට සම්බන්ධවීමට හැකියාව තිබෙන අතර ක්ලැසිෆයිඩ් ඇක්සෙස් (classified access) ඔස්සේ අන්තර්ජාලයට පිවිසීමේදී වැඩි කාර්යක්ෂමතාවයකින් හා ගුණාත්මකභාවයකින් යුක්ත සේවාවක් ලබාගත හැකි බව සඳහන් කරමි. ඒ සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාට දී තිබෙන යූස(ර්) නේම් (user name) හා පාස්ව(ර්)ඩ් (password) ඇතුළත් කළ යුතු බව අවධානය යොමු කරවමි.

මේ සම්බන්ධයෙන් දැනටමත් යූස(ර්) නේම් (user name) හා පාස්ව(ර්)ඩ් (password) ලබාගෙන නොමැති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් අදාළ විස්තර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර මෙවැනි පරිගණක පහසුකම් සම්බන්ධයෙන් යම් පුහුණුවීමක් අවශ්‍ය ගරු මන්ත්‍රීතුමන්ලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසද මෙයින් දන්වා සිටිමි."

**III**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව අනුව, 2016 මාර්තු 23 වන දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කරන ලද බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

සේවකයන්ගේ ජාතික අවම වේතනය

සේවකයන්ගේ අයවැය සහන දීමනාව"

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමුකළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් පිළිගන්වන ලදී.

එම ලිපි ලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(4) විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා විසින්,

(i) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් සාදන ලදුව 2015 ජූලි 21 දිනැති අංක 1924/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (බලපත්‍ර) රීති සහ 2015 අංක 1 දරන පරමාණුක බලශක්ති (ක්‍රියා පිළිවෙතක් පැවැත්වීමේ අදහස පිළිබඳ දැනුම් දීමේ) රීති; සහ

(ii) 2014 වර්ෂය සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව

පිළිගන්වන ලදී.

එම ලිපි ලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. පෙත්සම් :**

(1) (i) අරණායක, දෙමළහිරිය, "තිලක" යන ලිපිනයෙහි පදිංචි කේ. ඩී. එස්. පී කෝට්ටපොල මහතාගෙන් ලැබුණු 2015.12.20 දිනැති පෙත්සම; සහ

(ii) නෙළුම්දෙනිය, අක්වත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එච්. එම්. ලූවිස් සිංඤෝ මහතාගෙන් ලැබුණු 2015.10.23 දිනැති පෙත්සම

ගරු රංජිත් සියඹලාපිටිය මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) හන්දෙස්ස, හියාරාපිටිය, අංක 29/2 දරන ස්ථානයෙහි පදිංචි බී. ආර්. එම්. කපිල විජේරත්න මහතාගෙන් ලැබුණු 2016.02.22 දිනැති පෙත්සම; සහ

(ii) ගෙලිඔය, නව ඇල්පිටිය, අංක 485/C දරන ස්ථානයෙහි පදිංචි එම්. පී. ඩී. රම්‍යලතා මහත්මියගෙන් ලැබුණු 2016.02.19 දිනැති පෙත්සම

ගරු ලකී ජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) මතුගම, කළුතර පාර, අංක 173 දරන ස්ථානයෙහි පදිංචි සී. එල්. එම්. කේ. රාජපක්ෂ මහත්මියගෙන් ලැබුණු 2016.01.04 දිනැති පෙත්සම;

(ii) මතුගම, කළුතර පාර, අංක 173 දරන ස්ථානයෙහි පදිංචි සී. එල්. එම්. කේ. රාජපක්ෂ මහත්මියගෙන් ලැබුණු 2016.01.08 දිනැති පෙත්සම;

(iii) බුලත්සිංහල, ගෝවින්න, පැලපොල්වත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. ඒ. ඩී. චන්ද්‍රසේන මහතාගෙන් ලැබුණු 2016.02.02 දිනැති පෙත්සම;

(iv) බුලත්සිංහල, මීගහකුඹුර, අංක 292/2 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඩබ්ලිව්. සුගතදාස මහතාගෙන් ලැබුණු 2016.01.03 දිනැති පෙත්සම;

(v) අයගම, පල්ලේකඩ, මහත්තේහේන යන ලිපිනයෙහි පදිංචි කේ. ධනවතී මහත්මියගෙන් ලැබුණු 2016.01.23 දිනැති පෙත්සම;

(vi) හලාවත, මුන්නේෂ්වරම්, අංක 162 දරන ස්ථානයෙහි පදිංචි පී. කුලේන්ද්‍රම් මහතාගෙන් ලැබුණු 2016.01.03 දිනැති පෙත්සම;

(vii) මතුගම, ඉද්දගොඩ යන ලිපිනයෙහි පදිංචි සුනිල් ආනන්ද වීරසේකර මහතාගෙන් ලැබුණු 2016.02.16 දිනැති පෙත්සම;

(viii) පහළ කුඩලිගම, කන්දෙවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු 2015.12.28 දිනැති පෙත්සම; සහ

(ix) මතුගම හරහා, යට්ටපාත, 12 කණුව දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. පී. පී. ඒ. ධර්මදාස මහතාගෙන් ලැබුණු 2016.01.26 දිනැති පෙත්සම

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා විසින් පිළිගන්වන ලදී.

(4) අවිස්සාවේල්ල, උක්වත්ත, හැරී ගුණවර්ධන මාවත, අංක 4/19 දරන ස්ථානයෙහි පදිංචි පී. එල්. ඒ. ජී. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2016.02.06 දිනැති පෙත්සම ගරු එඩ්වඩ් ගුණසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) කළුතර දකුණ, පලාතොට, ගොඩපරගහහේන, අංක 699/11/3බී දරන ස්ථානයෙහි පදිංචි කේ. ඒ. එන්. උදය කුමාර මහතාගෙන් ලැබුණු 2016.02.01 දිනැති පෙත්සම ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(6) තලාව, හිඟුරුවැව, දුම්රිය මාවත යන ලිපිනයෙහි පදිංචි ජේ. එම්. ඒකනායක මහතාගෙන් ලැබුණු 2016.01.20 දිනැති පෙත්සම ගරු ශෙහාන් සේමසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(7) පොළොන්නරුව, ගල්ලැල්ල, සුදුනෙළුම්ගම, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි උපාලි වීරසිංහ මහතාගෙන් ලැබුණු 2016.01.29 දිනැති පෙත්සම ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) හබරණ, දඹුල්ල පාර, නිවාස 20, අංක 04 දරන ස්ථානයෙහි පදිංචි කේ. බී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු 2016.02.05 දිනැති පෙත්සම; සහ

(ii) සේනපුර, අක්කර සියය දරන ස්ථානයෙහි පදිංචි ආර්. පී. කුලතුංග මහතාගෙන් ලැබුණු 2016.02.05 දිනැති පෙත්සම

ගරු චන්දිම ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(9) කොච්චිකඩේ, මඩම්පැල්ල පාර, අංක 54/3 දරන ස්ථානයෙහි පදිංචි ජේ. ඒ. ආර්. එස්. ලාල් රුදිගු මහතාගෙන් ලැබුණු 2016.01.19 දිනැති පෙත්සම ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2016.03.24 වැනි දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 7.30 දක්වා විය යුතුය. පූ. භා. 10.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු සිරිනාල් ද මෙල් මහතා, ගරු කේ.කේ. පියදාස මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත බුද්ධශාසන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**8. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු ඉෂාක් රහුමාන් මහතා, ගරු මොහොමඩ් නවවි මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අකුරණ ජාමිආ රහ්මානියා අරාබි විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**9. කල් තැබීම (2016 මාර්තු 08 වැනි දින ගරු අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී කළ ප්‍රකාශය) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.07 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.26 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.59 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.25 ට, අද දින සභා සම්මතිය අනුව 2016 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.